**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මතය**

---

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා** ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරිම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය | ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය ඉක්මවූ පසු නිල නිවාසවලින් ඉවත්වීමට ලබාදුන් සහන කාලය ඉක්මවූ විට ආයතන සංග්‍රහය ප්‍රකාරව අයකළ යුතු මුදල් 2019 වර්ෂය තුළදී අයකර නොතිබුණි. තවද 2020 සැප්තැම්බර් මාසය වනවිට ගිවිසුම් කාලය ඉක්මවූ නිලධාරීන් 04 දෙනෙකු දින දීර්ඝ කරමින් තවදුරටත් නිල නිවාසවලම පදිංචි වී සිටී. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කර වෙනත් නිලධාරීන්ට අවස්ථා ලබා දීම. | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධයෙන් දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිවැරදිවේ. නිර්දේශ සටහන් කර ගතිමි.<br><br>අධ්‍යක්ෂ වරයෙකුට නිල නිවසේ රැදී සිටීමට අවසර දෙනු ලබන කාලය 2020.06.30 දක්වා දීර්ඝ කර ඇත. එසේ භාර දීමට ක්‍රියා නොකළ හොත් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7:1, 7:2 වගන්ති අනුව කටයුතු කරන බවත් ඔහු වෙත දන්වා ඇති අතර නැවත 2020 දෙසැම්බර් 31 දක්වා රැදී සිටීමට ඉඩ සලසා ඇත.<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකුට නිල නිවසේ රැදී සිටීමට ලබා දුන් කාලය 2020.11.07 දින සිට මාස 06 ක් දක්වා සාමාන්‍ය කුළිය මත රැදී සිටීම සඳහා දීර්ඝ කර ඇත. එම කාලය අවසානයේ නිල නිවස ආපසු භාර නොදුනහොත් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7:1, 7:2 වගන්ති අනුව කටයුතු කරන බව මා විසින් දන්වා ඇත.<br>නිලධාරිනියට නිල නිවසේ රැදී සිටීමේ කාලය 2020.10.31 දින දක්වා දීර්ඝ කර ඇති අතර, එදිනෙන් පසු ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7:1 හා 7:2 වගන්ති අනුව කටයුතු කරන ලෙස ආයතන ප්‍රධානියාට දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 | නිල නිවාසවලට අදාල ගොඩනැගිලි පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත 2017 ඔක්තෝබර් 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතුව තිබූ නමුත් මේ දක්වා එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | මෙම දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 05, නාරාහේන්පිට දාබරේ මාවතෙහි පිහිටි නිල නිවාස 07 හි මැනුම් කටයුතු 2020.09.11 හා 2020.09.18 දිනවල දී ශ්‍රී ලංකා මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඊට අදාල පිඹුරුපත් ඉදිරියේදී ලැබීමට නියමිතය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූලධන වියදම් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 85 ක් විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුවේ. | දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිවැරදි වේ. නිර්දේශ සටහන් කර ගතිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් 05 ක මූලික වියදම් ඇස්තමේන්තුව සහ පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 මගින් සංශෝධනය කිරීම්, මූලික වියදම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට සෘණ 30 හා සියයට 100 අතර පරාසයක විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතුවේ. | දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිවැරදි වේ. නිර්දේශ සටහන් කර ගතිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යයන් ඉටු නොකිරිම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 හා 2020 වර්ෂවලට අදාලව රාජ්‍ය ආයෝජන වැඩ සටහන යාවත්කාලීන වී නොතිබුණ අතර ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ ඇතුලත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ | ආර්ථිකයට ජාතික වශයෙන් වැදගත්කමක් ඇති රාජ්‍ය ආයෝජන වැඩසටහන වාර්ෂිකව යාවත්කාලීන වීම හා මුදල් | දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිවැරදි වේ. නිර්දේශ සටහන් කර ගතිමි. |

| | | |
|---|---|---|
| කාර්යභාරය පැහැදිලි කරන්නාවූ රෙගුලාසි වර්තමානයට උචිත වන පරිදි සංශෝදනය කර ඇති බවද නිරික්ෂණය නොවීය. | රෙගුලාසි සංශෝධනයවීම කාලෝචිත වන බැවින් ඒ සඳහා කටයුතු කල යුතු වේ. | |

## 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බටහිර වෙරළ තීරයේ වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි නිසි ආර්ථීක, සමාජීය හා පාරිසරික විශ්ලේෂණයක් සිදුකර නොමැති බැවින් එවැන්නක් සිදුකිරිම සඳහා තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් හා ඒ මත පදනම්ව නව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස අදාල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත දන්වා තිබුණද, එවැන්නක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු රාජ්‍ය ආයෝජන වැඩසටහන ප්‍රකාරව අයවැය ප්‍රතිපාදන සැලසිය යුතු වුවද නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර අයවැය ප්‍රතිපාදන සලසා තිබූ බව නිරීක්ෂණය කෙරේ.<br><br>තවද එම ව්‍යාපෘති යෝජනාව කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා ක්‍රියාත්මක කිරීම තිරසාර විසඳුමක් ලෙස හැඟේ නම් යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අදහස ලෙස දක්වා තිබුණ ද එමගින් අවශ්‍ය නියාමනය ගිලිහී යා හැකි බවද නිරීක්ෂණය කෙරේ. | ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම කළ යුතු වේ. | දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිවැරදි වේ. නිර්දේශ සටහන් කර ගතිමි. |